# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1
# දරන වත්කම් හා බැරකම්
# ප්‍රකාශ කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන
වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

[සහතික සටහන් කළේ 1975 පෙබරවාරි මස 4 වන දින]

එල්.ඩී.—ඕ. 59/71.

ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති ස්වකීය වත්කම් හා බැරකම් වරින් වර ප්‍රකාශ කරන ලෙස ඇතැම් නියමිත ප්‍රවර්ගවලට අයත් තැනැත්තන්ට බල කිරීම පිණිස ද ; උචිත බලධරයන් විසින් ඒ ප්‍රකාශ බලනු ලැබීමක් මේ පනත අදාළ තැනැත්තකුට විරුද්ධව යම් නිවේදනයක් ලැබුණු විට විමර්ශන පැවැත්වීමක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; වත්කම් හා බැරකම් ප්‍රකාශ නොකිරීම සහ අසත්‍ය ප්‍රකාශ කිරීම ගැන දණ්ඩන නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන, මේ පනතෙහි මින් මතු '' නියමිත දිනය '' යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වේ.

**මේ පනත අදාළ කිරීම.**

2. (1) මේ පනතෙහි විධිවිධාන පහත සඳහන් පුද්ගල පන්ති හෝ වර්ග අතුරින් යම් පන්තියකට හෝ වර්ගයකට අයත් සැම තැනැත්තකු කෙරෙහි අදාළ වන්නේ ය :—

(අ) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරු ;

(ආ) ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පත් කරනු ලැබූ විනිශ්චයකාරවරයන් හා වෙනත් රාජ්‍ය නිලධරයන් සහ අමාත්‍යාංශවල හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයෝ ;

(ඇ) රාජ්‍ය සංස්ථාවල සභාපතිවරයන්, අධ්‍යක්ෂවරයන්, මණ්ඩලවල සාමාජිකවරයන් සහ මාණ්ඩලික නිලධරයෝ ;

(ඈ) පළාත් පාලන ආයතනවලට තෝරා පත් කරනු ලැබූ සාමාජිකයන් සහ ඒවායේ මාණ්ඩලික නිලධරයෝ ; සහ

(ඉ) නියෝග මගින් නියම කරනු ලබන ප්‍රවර්ගවලට අයත් වෙනත් නිලධරයෝ.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ක්‍රියාත්මක වීම කරණකොට ගෙන මේ පනතේ විධිවිධාන අදාළ වන තැනැත්තෙක් '' මේ පනත අදාළ තැනැත්තෙක් '' යනුවෙන් මේ පනතෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

**වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම මේ පනත අදාළ තැනැත්තන්ගේ යුතුකම බව.**

3. (1) මේ පනත අදාළ සැම තැනැත්තකු විසින්, ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් නියම කරනු ලබන දිනයක පවත්නා පරිදි—

(අ) තමාගේ සියලු වත්කම් හා බැරකම් ;

(ආ) තම ස්වාමි පුරුෂයාගේ/භාර්යාවගේ සියලු වත්කම් හා බැරකම් ; සහ

ඒ 09443—9512 (74/09)

(ආ) තමාගේ එක් එක් දරුවාගේ සියලු වත්කම් හා බැරකම් ද

පිළිබඳව, නියම කරනු ලැබිය හැකි ආකෘතියක් අනුව, නියමිත දිනයෙන් පසු මාස තුනක් ඇතුළත, මේ පනතෙහි මින් මතු '' වත්කම් හා බැරකම් ප්‍රකාශය '' ක් යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රකාශයක් කළ යුතු ය.

(2) නියමිත දිනයෙහි දී මේ පනත අදාළ නොවන තැනැත්තකු ඉන්පසු මේ පනත අදාළ තැනැත්තකු බවට පත්වන අවස්ථාවක, තමා මේ පනත අදාළ තැනැත්තකු බවට පත් වූ දිනයෙන් පසු මාස තුනක් ඇතුළත, අන්තිමට සඳහන් වූ දිනයෙහි පවත්නා පරිදි වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ඔහු විසින් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබීමට තැනැත්තකුට නියමිත වත්කම් හා බැරකම් ප්‍රකාශය, ඒ තැනැත්තා මේ පනත අදාළ තැනැත්තකුව සිටීම අවසන් වුවහොත් මිස, පළමුවන වත්කම් හා බැරකම් ප්‍රකාශය කිරීමෙන් පසු සෑම අවුරුදු සයක් පාසා නැතහොත් ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් තීරණය කරනු ලබන ඊට වඩා කෙටි කාලීන අන්තරවලින් වරින් වර ඉදිරිපත් කළ යුතු ය.

වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුත්තේ කවරකු වෙත ද යන වග.

4. වත්කම් හා බැරකම් ප්‍රකාශ—

(අ) (i) ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයා විසින්,
(ii) අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් විසින්, හා
(iii) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ විනිශ්චයකාරවරයන් හා වෙනත් රාජ්‍ය නිලධරයන් විසින්

ජනාධිපතිවරයා වෙත ද ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් නොවූ, ජාතික රාජ්‍ය සභාවේ වෙනත් සියලු මන්ත්‍රීවරයන් විසින් ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයා වෙත ද ;

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ විනිශ්චයකාරවරයන්, කාර්මික ආරාවුල් පනත යටතේ කම්කරු විනිශ්චය අධිකාර වශයෙන් ක්‍රියා කරන්නාවූ රාජ්‍ය නිලධරයන්, සහ විනිශ්චයමය ස්වභාවයක් ඇති කාර්ය ඉටු කිරීම යම් ධුරයක ප්‍රධාන කාර්ය හෝ කාර්යයන් වේද එවැනි ධුර දරන්නාවූ රාජ්‍ය නිලධරයන් විසින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත ද ;

(ඈ) (i) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්,
(ii) රාජ්‍ය සංස්ථාවල සභාපතිවරයන් සහ අධ්‍යක්ෂවරයන් විසින්, හා
(iii) අමාත්‍යාංශවල මාණ්ඩලික නිලධරයන් විසින්

ඒ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද ;

(ඉ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන් විසින් ඒ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත ද ;

(ඊ) රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික නිලධරයන් විසින් ඒ ඒ සංස්ථාවේ සභාපති වෙත ද ;

(උ) පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් සහ සභාපතිවරුන් විසින් පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද ;

(ඌ) පළාත් පාලන ආයතනවලට තෝරා පත්කර ගනු ලැබූ වෙනත් සාමාජිකයන් විසින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ද ;

(එ) පළාත් පාලන සේවයේ සාමාජිකයන් වූ පළාත් පාලන ආයතනවල මාණ්ඩලික නිලධරයන් විසින් පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා වෙත ද ;

(ඒ) අමාත්‍යවරයා විසින් යාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ප්‍රවර්ගවලට අයත් නිලධරයන් විසින්, එම නියෝගවල නියම කරනු ලබන තැනැත්තන් වෙත ද

ඉදිරිපත් කළ යුතු ය.

වත්කම් හා බැරකම් ප්‍රකාශ බැලීමට ඇති බලය.

**5.** (1) රාජ්‍ය නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක නැතහොත් පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකු හෝ පත් කිරීම, උසස් කිරීම, සේවා ස්ථානයෙන් මාරුකිරීම හෝ ද්විතීයනය කිරීම පිළිබඳ වගකීම දරන යම් තැනැත්තකුට, මණ්ඩලයකට හෝ අධිකාරයකට, ඒ කාර්යය සඳහා, එම රාජ්‍ය නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගෙන්වා බැලීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) නීතිපතිවරයාට, රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂවරයාට, අල්ලස් කොමසාරිස්වරයාට, දේශීය ආදායම් කොමසාරිස්වරයාට සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගෙන්වා ගෙන බැලීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

අතිරේක තොරතුරු ගෙන්වා ගැනීමට අල්ලස් කොමසාරිස්වරයාට ඇති බලය.

**6.** මේ පනත යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් කර ඇති යම් තැනැත්තකුගෙන් අල්ලස් කොමසාරිස්වරයාට අවශ්‍ය වන අතිරේක තොරතුරු ඔහු විසින් ඕනෑම වේලාවක දී ඉල්ලා සිටිය හැකි අතර ඒ තොරතුරු හෝ මේ පනත යටතේ කරන ලද ප්‍රකාශය හෝ ඔහු විසින් අල්ලස් පනත යටතේ වූ ස්වකීය කාර්යයන් ඉටු කිරීම සඳහා යොදවා ගත හැකි ය.

යම් තැනැත්තකු විසින් කරනු ලබන ලිඛිත නිවේදන සම්බන්ධ කාර්ය පටිපාටිය සහ ප්‍රසිද්ධ ප්‍රකාශ තහනම් කිරීම.

**7.** (1) යම් තැනැත්තකු විසින්, ඔහු විසින් අත්සන් කොට උචිත බලධරයකු වෙත යවනු ලබන ලියවිල්ලකින් වූ නිවේදනයක් මගින්, මේ පනත අදාළ යම් තැනැත්තකුට ඇති බව දන්නා ධන මාර්ග හා ආදායම් මාර්ග සමග නො ගැළපෙන බව ඉහත කී නිවේදනය යවන තැනැත්තා දන්නාවූ මේ පනත අදාළ ඒ තැනැත්තා විසින් මෑතක දී අත් කර ගන්නා ලද යම් ධනයක් හෝ දේපළක් හෝ මෑතක දී කරන ලද යම් මුදල් ගනුදෙනුවක් හෝ වෙළෙඳ ගනුදෙනුවක් හෝ මෑතක දී දරන ලද යම් වියදමක් හෝ සම්බන්ධයෙන් එකී උචිත බලධරයාගේ අවධානය යොමු කරවිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ලිඛිත නිවේදනයක් උචිත බලධරයා වෙත ලැබුණු විට, එම නිවේදනය නිර්ව්‍යාජ යයි ද විමර්ශනයක් පැවැත්විය යුතු කරුණු එම නිවේදනයෙන් එළිදරව් වන්නේ යයි ද ඔහු

සැහිමට පත් වුවහොත්,පහත සඳහන් සියලු ම කරුණු හෝ යම් කරුණක් තීරණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විමර්ශනයක් ඔහු විසින් පැවැත්විය යුතු ය :—

(අ) අල්ලස් පනතේ හෝ විනිමය පාලනයට හෝ දේශීය ආදායමට අදාළ නීතියේ විධිවිධාන යටතේ නඩු පැවරීම හෝ වෙනත් සුදුසු ක්‍රියා කිරීම ;

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ නඩු පැවරීම.

තව ද, තමා වෙත ලැබුණු ලිඛිත නිවේදනය සම්බන්ධයෙන් වෙනත් යම් උචිත බලධරයකු ක්‍රියා කළ යුතු යයි ඒ උචිත බලධරයාට පෙනී ගියහොත් ඔහු විසින් ඒ නිවේදනය ඒ වෙනත් බලධරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ලැබී ඇති යම් නිවේදනයක දක්වෙන කරුණු විමර්ශනය කිරීමට යම් උචිත බලධරයකු තීරණය කළ විට, මේ පනත යටතේ කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ ගෙන්වා ගෙන පරීක්ෂා කිරීම ද නිවේදනය කළ තැනැත්තා කැඳවා ප්‍රශ්න කිරීම ද නැත හොත් කැඳවනු ලැබීමට හා ප්‍රශ්න කරනු ලැබීමට සැලැස්වීම ද ඒ බලධරයා විසින් කළ හැකි ය. තව ද විමර්ශන පැවැත්වීමටත් ඒ විමර්ශන හැකි තාක් ඉක්මණින් හා කෙසේ වෙතත් ඒ ලිඛිත නිවේදනය ලැබී මාස හයක කාලයක් ඉකුත් වීමට පෙර නිම කිරීමටත් ඒ උචිත බලධරයා විසින් සැලැස්විය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනත අදාළ යම් තැනැත්තකුගේ දන්නා ධන මාර්ග හා ආදායම් මාර්ග සමග නොගැළපෙන ධනය හෝ දේපළ ඒ තැනැත්තා විසින් මෑතක දී අත්කර ගන්නා ලදැයි හෝ එවැනි මුදල් ගනුදෙනු හෝ වෙළෙඳ ගනුදෙනු මෑතක දී කරන ලදැයි හෝ එවැනි වියදම් මෑතක දී දරන ලදැයි හෝ කියා සිටිමින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම හෝ තමා විසින් (1) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ කරන ලද ලිඛිත නිවේදනයක් මත උචිත බලධරයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් විමර්ශනයක් සම්බන්ධයෙන් ඔහු විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම හෝ වරදක් වන්නේ ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වරදක් කරන යම් තැනැත්තෙක්, මහේස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(6) මේ වගන්තියෙහි " උචිත බලධරයා " යන්නෙන් නීතිපතිවරයා, රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂවරයා, අල්ලස් කොමසාරිස්වරයා, දේශීය ආදායම් කොමසාරිස්වරයා, විනිමය පාලක දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ ප්‍රධාන රේගු අයකැමි අදහස් වෙති.

රහස්‍යතාව රැකීම සහ රහස්‍යතා දිවුරුම.

8. (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී තමාට දැනගන්නට ලැබිය හැකි, මේ පනත අදාළ වන යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන්, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමෙහි දී හැර, රහස්‍යතාව රැකීම ද රහස්‍යතාව රැකීමට ආධාර කිරීම ද සෑම තැනැත්තකු විසින් කළ යුතු අතර ඒ කිසිම කාරණයක් එය අදාළ වන තැනැත්තාට හැර අන් කිසිම තැනැත්තකුට දැනුම් දීම හෝ මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමෙහි දී තමා සන්තකයට පත් වන ලේඛන හෝ වාර්තා කිසිවක් බලය නොලත් කිසිම තැනැත්තකුට බැලීමට ඉඩ හැරීම හෝ ඔහු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ රහස්‍යතාව රැකීමට සහ රහස්‍යතාව රැකීමට ආධාර කිරීමට නියමිත සෑම තැනැත්තකු ම, නියම කරනු ලබන ආකාරයක රහස්‍යතා දිවුරුමක් සමාදාන විනිශ්චයකාර වරයකු ඉදිරියේ දී අත්සන් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ රහස්‍යතාව රැකීමට සහ රහස්‍යතාව රැකීමට ආධාර කිරීමට නියමිත යම් තැනැත්තකුට, මේ පනත හෝ අල්ලස් පනත හෝ විනිමය පාලන පනත හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත හෝ රේගු ආඥාපනත හෝ යටතේ පවරන ලද හෝ පැවරීමට තිබෙන යම් නඩු කටයුත්තක් සඳහා හෝ එම පනත්වල විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය විය හැකි පරිදි හැර, කිසි ම වත්කම් හෝ බැරකම් ප්‍රකාශයක් හෝ ඒ හා සම්බන්ධ වෙනත් යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීමට හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට දැනගන්නට ලැබෙන යම් කිසි කාරණයක් හෝ දෙයක් යම් අධිකරණය කට එළිදරව් කිරීමට හෝ දැනුම් දීමට හෝ නියම නොකළ යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් දෙදහසක් නොඉක්ම වන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

වැරදි.

9. (1) (අ) 3 වන වගන්තිය යටතේ කරනු ලැබීමට තමාට නියමිත යම් වත්කම් හෝ බැරකම් ප්‍රකාශයක් කිරීම යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින ; හෝ

(ආ) එකී යම් ප්‍රකාශයක යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඇ) සපයන ලෙස මේ පනත යටතේ අල්ලස් කොමසාරිස් වරයා විසින් නියම කරනු ලබන යම් අතිරේක තොර තුරක් සැපයීම යුක්තිසහගත හේතුවක් නොමැතිව පැහැර හරින ; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන කිසිවක් අන් ලෙසකින් කඩ කරන

තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, වෙන යම් දණ්ඩනයක් සඳහා අන් ආකාරයකින් විධිවිධාන සලස්වා ඇතහොත්

මිස, ඒ තැනැත්තා රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු විසින්, සමං වරදකරු කරනු ලැබීමේ දිනයෙන් පසු දවස් දහතරක කාලයක් ඇතුළත හෝ ඒ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක ඒ වරදකරු කිරීම ස්ථිර කරනු ලැබීමේ දිනයෙන් පසු දවස් දහතරක කාලයක් ඇතුළත, 3 වන වගන්තියෙහි සඳහන් වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය. 3 වන වගන්තියේ විධිවිධාන සහ මේ පනතේ මීට ඉහතින් වූ වෙනත් වගන්තිවල විධිවිධාන, 3 වන වගන්තිය යටතේ කරන ලද යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයකට අදාළ වන ආකාරයට හා ප්‍රමාණයට ම, මේ උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් කරන ලද යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයකට ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම සහ ඒ වරද නොකඩව කරන එක් එක් දවසකට රුපියල් පනහ බැගින් වැඩිදුරටත් වූ දඩයකට ද යටත් වන්නේ ය.

(4) අධිකරණයක් විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වූ යම් වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරදකරු කිරීමේ සිද්ධිය මේ පනත යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශය කිරීමට ඒ වරදකරු කරනු ලැබූ තැනැත්තා බැඳී සිටියේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට දැනුම් දීම අධිකරණයේ යුතුකම වන්නේ ය.

(5) මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා නීතිපතිවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස කිසිම නඩුවක් නොපැවරිය යුතු ය.

නියෝග.

10. (1) (අ) නියම කරන ලෙස මේ පනතින් නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් ද ;

(ආ) 2(1) වන වගන්තියේ (ඉ) ඡේදයේ කාර්යය සඳහා නිලධාරී ප්‍රවර්ග සහ ඒ ප්‍රවර්ගවලට අයත් නිලධරයන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු තැනැත්තා නියම කිරීම සම්බන්ධයෙන් ද ;

(ඇ) මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කරුණු පිළිබඳව ද

අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන කිසිම නියෝගයක් එය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු ක්‍රියාත්මක නොවන්නේ ය.

**11.** මේ පනතේ විධිවිධාන වෙන යම් නීතියක විධිවිධාන හා සමඟ ගැටෙන විට හෝ ඊට අනුකූල නොවන විට මේ පනතේ විධිවිධාන බලපැවැත් විය යුතු ය. මේ පනත වෙනත් නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි — අර්ථ නිරූපණය.

" දරුවා " යන්නෙන්—

(අ) අවිවාහක වූ ද වයසින් අවුරුදු දහ අටට අඩු වූ ද දරුවෙක් ; හෝ

(ආ) වයසින් අවුරුදු දහ අටක් හෝ ඊට වැඩි වූ නමුත් තම පියාගෙන්/මවගෙන් හෝ දෙමව්පියන්ගෙන් යැපෙන දරුවෙක්

අදහස් වන අතර සුළු දරුවෙක් හෝ දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ හදා ගත් දරුවෙක් ද ඊට ඇතුළත් වේ ;

" නියමිත " යන්නෙන් නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

" පළාත් පාලන ආයතනය " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

" පළාත් පාලන කොමසාරිස්වරයා " යන්නට යම් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්වරයෙක් සහ යම් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙක් ද ඇතුළත් වේ ;

" මාණ්ඩලික නිලධරයා " යන්නෙන්—

(අ) ආණ්ඩුවේ හෝ පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට, වර්ෂයකට රුපියල් 6,720 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයක් ඇති යම් ධුරයක් දරන යම් නිලධරයෙක් අදහස් වේ ; තව ද

(ආ) රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට, වර්ෂයකට රුපියල් 7,200 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයක් ඇති යම් ධුරයක් දරන යම් නිලධරයෙක් අදහස් වේ ;

" රාජ්‍ය සංස්ථාව " යන්නෙන් ප්‍රදාන හෝ ණය හෝ වශයෙන් නැත හොත් වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන් සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ

වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර අල්ලස් පනතෙහි අර්ථානුකූල වූ සියලු " උපලේඛනගත ආයතන " ද 10 වන වගන්තිය යටතේ නියෝග මගින් නියම කරනු ලබන වෙනත් ආයතන හෝ පුද්ගල මණ්ඩල ද ඊට ඇතුළත් වේ ;

" වත්කම් හා බැරකම් " යන්නෙන් ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති වත්කම් හා බැරකම් අදහස් වන අතර චංචල හා නිශ්චල දේපළ ද ඊට ඇතුළත් වේ.